**මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස**
**පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

# ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

# තනතුරු පුරප්පාඩු

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුරු** — **සහකාර අධ්‍යක්ෂ (මහවැලි ආරක්ෂක)**
**සේවා ගණය** — කළමනාකාර (MM 1-1 සේවා ගණය)
**වැටුප් පරිමාණය** — රු. 53,175 - 10X1,375 - 15X1,910 - 95,575/-

**සුදුසුකම් (පහත සුදුසුකම් 1) :**

01. ආරක්ෂක හමුදාවල අධිකාරිලත් නිලධාරියෙක් හෝ ශ්‍රී ලංකා පොලිසියේ සහකාර පොලිස් අධිකාරී තනතුරක සේවය කර තිබීම. (මෙම අයදුම්කරුවන් විධිමත් ලෙස අදාළ සේවාවෙන් ඉවත් වී තිබිය යුතු ය.)

**වයස :** අවු. 22 ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමය :**

ලිඛිත තරග විභාගයක් හා / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක්

තමා විසින් සකස් කර ගත් ජීවදත්ත පත්‍රිකාවක් 2020.12.24 වන දිනට හෝ එදිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී.බී. ජයා මාවත, කොළඹ 10 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුව ඇත.

අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු අතර, නියමිත දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බවද දන්වමි. අයදුම්පත සමග අධ්‍යාපන / වෘත්තීය සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, එම සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙම කටයුතු සම්බන්ධව අවසන් තීරණය ගැනීම අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු බවද දන්වමි.

**සැ.යු. -** අයදුම්පත් භාරගන්නා අවසන් වන දිනය වන විට තනතුරට අදාළ සුදුසුකම් සපුරා තිබිය යුතු බව කාරුණිකව සලකන්න.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.**